# 12 පාඩම - කාව්‍ය නිර්මාණය.

**කාව්‍ය නිර්මාණයට පෙර අපි කවිය යනු කිමෙක් දැයි සොයා බලමු.**

කවිය යනු මානව ශිෂ්ටාචාරය සතු උත්තම කලා මාධ්‍යයකි. කවිය පිළිබඳව පෙර පර දෙදිග සාහිත්‍ය සාහිත්‍යය විචාරකයෝ විවිධ නිර්වචන ඉදිරිපත් කළහ. අපි එම නිර්වචන කිහිපයක් හඳුනා ගනිමු. ඒ පිළිබඳව අවධානය යොමු කරමු.

- රසය ආත්මකොට ගත් වාක්‍යය කාව්‍යය යි. **(විශ්වනාථ)**
- රමණීය අරුත් ප්‍රතිපාදනය කරන ශබ්දය කාව්‍යය යි. **(ජගත් කතා)**
- කවිය යනු අනුත්සාහතව ගලා යන ප්‍රබල හැඟීම් ය.**(විලියම් වර්ඩ්ස් වර්ත්)**
- කවිය වනාහි හොඳම වචන හොඳම පිළිවෙලට යෙදීම යි. **(එස්. ටී. කොල්රිජ්)**
- අභ්‍යන්තර වූ ගුණ සමුදායකින් විශිෂ්ට වූ රචනය කාව්‍යය යි. **(ඇරිස්ටෝටල්)**
- කවිය අපගේ හද බසයි. කවි චින්තාවන් සතු ප්‍රධාන ගුණාංගය නම් අසන්ක විධ අරුත් සහෘර්දයාගේ මනස තුළ උත්පාදනය කිරීමේ ශක්තිය යි. **(ගුණදාස අමරසේකර)**

කවිය යනු එසේ නම්, එම කවි නිර්මාණය කරන්නා කවියාය.

## කවියා නම් කවරෙක්ද?

විවිධ ලක්ෂණයන්ගෙන් යුතු ජීවිතය දෙසත් ස්වභාවධර්මය දෙසත් ඒ ස්වභාව ධර්මය තුල ජනනය වන සුන්දරත්වය දෙසත් බලා එහි තතු රසවත්ව, නිවැරදිව, නවතාවයකින් යුතුව, කලාත්මක ලෙස ලෝකයාට බෙදන්නා නොහොත් දෙන්නා කවියායි.

හොඳ කවියෙකු සතු ගුණාංග තුනක් පෙරදිග විචාරකයෝ පෙන්වා දෙති.

- ප්‍රතිභාව
- ව්‍යුත්පත්තිය
- සතතාභ්‍යාසය
- ප්‍රතිභාව

## ප්‍රතිභාව

ප්‍රතිභාව යනු උපන් හපන්කමයි. අභිනව ගුප්ත පඬිවරයා ප්‍රතිභාව යැයි කියන්නේ අපූර්ව වස්තු නිර්මාණය කළ හැකි ප්‍රඥාවට යි.කවියාගේ ප්‍රතිභාව වූ කලී අත්දැකීම් යළි යළිත් සිහි කිරීමෙන් නැතහොත් පරිකල්පනයෙන් පෝෂණය ලබන්නකි.

## ව්‍යුත්පත්තිය

ජීවිතාවබෝධය නිර්මාණයක් කළ හැකිය තවද ජීවන තක්සලාවෙන් ලබන පරිණත බුද්ධියත් ග්‍රන්ථ පරිශීලනයෙන් ලබන බහුශෘත භාවයත් සංචාරය කිරීමෙන් ලබන පරිණත අවබෝධයක් ව්‍යුත්පත්තිය ලෙස හැඳින්විය හැකිය.

ව්‍යුත්පත්තිය හීන වූවකු ගෙන් පාඨකයාගේ කල්පනා ශක්තිය පුබුදුවාලන අන්දමේ උසස් නිර්මාණයක් අපේක්ෂා කළ නොහැකිය.

## සතතාභ්‍යාසය

සතතාභ්‍යාසය යනු නිරන්තරයෙන් දිවි මෙහි හා කියවීමෙහි යෙදීමයි. කවිත්වයෙන් නිරායාසයෙන් පහළ වන්නක් නොවේ නිරතුරුව පුරුදු පුහුණු කිරීමෙන් ගත යුත්තකි.

කාව්‍ය නිර්මාණයේදී අනුභූතිය හෙවත් අත්දැකීම ද ඉතා වැදගත්ය.සංකීර්ණ ජීවිතෙන් ලබාගත් අත්දැකීම ස්වභාවධර්මය හා සෞන්දර්යය පිළිබඳව පළපුරුද්ද, විවේකීතාව, සංයමය හා බහුශ්‍රැතතාව යන කාරණා වලින් වැඩුණු කවියා තුළ කවි ප්‍රභාවත් හටගනී.

**අත්දැකීමක් රසවත් නිර්මාණයක් බවට පත් කිරීමේදී කවියා විවිධ කාව්‍යෝපක්‍රම භාවිත කරයි.**

1. **උචිතතම පද යෙදීම**
2. **කාව්‍ය ආකෘතිය**
3. **රිද්මය**
4. **සංකල්ප රූප**
5. **සංක්ෂිප්ත බව**

- පෙළ පොතේ දොළොස් වෙනි පාඩම හොඳින් කියවන්න.
- මෙම කරුණු සටහන් පොතේ ලියා ගන්න.
- පහත දැක්වෙන ප්‍රශ්න වලටත් පිළිතුරු ලියන්න.

1. “කවිය” යන්නට නිර්වචනයක් ලියන්න.

   ....................................................................................................................

2. අපූර්ව වස්තු නිර්මාණයක් කිරීමේ හැකියාව හැඳින්වෙන්නේ කුමන නමකින්ද?

   ....................................................................................................................

3. හොඳ කවියකු වීමට බලපාන හේතු තුනක් ලියන්න.
   i. ....................................................................................................
   ii. ....................................................................................................
   iii. ....................................................................................................

4. පරිකල්පනය යනු කුමක් ද?

.......................................................................................................................

...............................................................................................................

5. ප්‍රතිභාව පිළිබඳ නිර්වචනයක් සැපයූ පඬිවරයා නම් කරන්න.

.......................................................................................................................

6. 'අත්දැකීම' හැඳින්වෙන වෙනත් නම් ලියන්න.

.......................................................................................................................

.......................................................................................................................

7. කවියාගේ මාධ්‍යය වන්නේ කුමක් ද?

.......................................................................................................................

8. ඔබ මෙම පාඩමෙන් ඉගෙන ගත් කාව්‍යෝපක්‍රම තුනක් ලියන්න.

   i. ...............................................................................................................
   ii. ...............................................................................................................
   iii. ...............................................................................................................

9. උසස් කාව්‍ය නිර්මාණයක් අපේක්ෂා කළ නොහැක්කේ නිර්මාණ කරුවා කුමකින් හීන වුවොත් ද?

.......................................................................................................................

10. විශිෂ්ට නිර්මාණයක් කිරීමට ඔබ කළ යුත්තේ කුමක් ද?

.......................................................................................................................

.......................................................................................................................

.......................................................................................................................